සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 9 - 2017

නම : .............................................. සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය : පැය 2යි.

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සහ 2 ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(1) සම්මත සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අක්ෂර සංඛ්‍යාව,
(i) 10 කි. (ii) 18 කි. (iii) 42 කි. (iv) 60 කි.

(2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
(i) ලේඛණය (ii) වර්නය (iii) මැතිවරණය (iv) දක්ෂින

- අංක 3 සිට 5 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පද කුමන වියරණ වර්ගයට අයත් වේදැයි තෝරා යටින් ඉරක් අඳින්න.

(3) සෑම දරුවෙකුම දෙමාපියන්ට හොඳින් <u>සැලකුවහොත්</u> වැඩිහිටි නිවාස අවශ්‍ය නොවේ.
(i) ප්‍රයෝජ්‍ය ක්‍රියා (ii) මිශ්‍ර ක්‍රියා (iii) පූර්ව ක්‍රියා (iv) අසම්භාව්‍ය ක්‍රියා

(4) නිළිය <u>සුමිහිරි</u> ගීතයක් ගයමින් රංගනයක යෙදුනාය.
(i) පූර්ව ක්‍රියා (ii) තද්ධිත (iii) උපසර්ග පද (iv) ප්‍රයෝජ්‍ය ක්‍රියා

(5) මේ දිනවල ලංකාවේ <u>බොහෝ</u> ප්‍රදේශ වල දැඩි නියං තත්වයක් පවතී.
(i) නිපාත (ii) උපසර්ග පද (iii) කෘදන්ත (iv) තද්ධිත

(6) පහත දී ඇති අනුක්ත පදවලට ගැළපෙන උක්ත පදය ලියා දක්වන්න.

(i) රෝගීන් ..........................................

(ii) කුමරියක ..........................................

(7) මුලින් දක්වා ඇති අදහස ප්‍රකාශ කෙරෙන පිරුළ තෝරා ඒ යටින් ඉරක් අඳින්න.
වරදක් කළොත් සිත එයට සාක්ෂි දරයි.
(i) හිත ඇත්නම් පත කුඩාද
(ii) වැරදුනු දාට කවුරුත් නැත තමන් මිස
(iii) අඹ කෑ මිනිහගේ මොළේ දන්නා වගේ.
(iv) අනුන්ගේ වරද ලොකුවට පේනවා වගේ.

(8) පහත දී ඇති වචන යොදා අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.
(i) ප්‍රීතිමත් (ii) කෘතිම

(i) ..................................................................................................................

(ii) ..................................................................................................................

(9) පහත දී ඇති වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.
(i) වැහි වලාවෝ අහසේ පාවෙයි.
(ii) ඔවුන් අනතුරට ලක් වූවන් රෝහල් වෙත රැගෙන ගියහ.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

(10) පහත දී ඇති පදවලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(i) රාත්‍රී කාලයේ සැරිසරන - .........................................................

(ii) දූවයෙන් කරන ලද - .........................................................

(11) පහත දැක්වෙන පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

(i) නෙළුම - ........................................................., .........................................................

(ii) අහස - ........................................................., .........................................................

(12) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(i) දක්ෂ - .........................................................

(ii) සරල - .........................................................

(13) පහතින් දැක්වෙන පුරුෂ ලිංග පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.

(i) අලියා - .........................................................

(ii) මාළුවා - .........................................................

(14) පහත දැක්වෙන පදවලට ගැළපෙන උපසර්ග පද යොදා නැවත ලියන්න.

(i) මානය - .........................................................

(ii) දුක් - .........................................................

v **ප්‍රශ්න අංක 15 සිට 20 තෙක් හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.**

**(ඉමහත්, උදහස, අනලස්ව, කළහොත්, ප්‍රසාදයක්, අරක්වළ, ගැඹුරු, ගොයම් පීදීම)**

(15) ගොයමේ වී කරල් මතුවීම .................................. යනුවෙන් හැඳින්වේ.

(16) කමත මැද ආරක්ෂාව සඳහා තනන්නේ ........................................කි.

(17) විශ්වය පිළිබඳ දැනුම් සම්භාරය .......................................... සාගරය වැනිය.

(18) අර පිරිමැස්මෙන් වියදම් ...................................... අතමිට සරුවේවි.

(19) කම්කරුවෝ .................................... තම කටයුතු ඉටු කරති.

(20) ඔහුගේ ජයග්‍රහණය ගැන ඇසූ අපි ...................................... සතුටට පත්වීමු (ලකුණු 2 x 20 = 40 යි)

## II කොටස

v 1,2,3,4 යන ප්‍රශ්නවලට හා 5,6 යන ප්‍රශ්න දෙකෙන් එකකටත් පිළිතුරු සපයන්න.

(1) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''ලංකා ලංකා පෙම්බර ලංකා'' ගීතයේ ගායකයා නම් කරන්න.
(ii) පහත දැක්වෙන වචනවල අර්ථය ලියන්න.
(අ) යතුර
(ආ) වැදම
(iii) 'රන්මුතුදූව සහ තවත් ජනකතා' ග්‍රන්ථයේ රචකයා නම් කරන්න.
(iv) 1956 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම සම්මාන පුරවැසියා වීමේ ගෞරවය හිමි කරගත් විද්වතාගේ නම ලියන්න.
(v) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කුමන යුගය ද?
(vi) ගිරා සංදේශ කාව්‍ය ලියන සමයේ කෝට්ටේ රජකල රජතුමා කවුද?
(vii) මහින්ද කුමාර දළුපොත මහතාගේ 'වටපිළ' ග්‍රන්ථය ඇසුරෙන් සකස් කරන ලද පාඩමේ නම ලියන්න.
(viii) වී වැපිරීමේ දී කුරුලු ගොබෙයියන් වෙනුවෙන් වෙන් කරන කනටිය හඳුන්වන නම කුමක් ද?
(ix) 'කලවිට' නමින් හැඳින්වෙන ස්ථානය නම් කරන්න.
(x) පුවත්පත් වාර්තාවක මාතෘකාව හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(ලකුණු 1 x 10 = 10)

(2) පහත සඳහන් මාතෘකා අතුරින් **එකක්** තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනාවක් ලියන්න.
(i) සන්නිවේදන තාක්ෂණයේ දියුණුවෙන් මිනිසා ලැබූ ජයග්‍රහණ
(ii) කසල කළමනාකරණයේ වැදගත්කම
(iii) ජල සම්පත සුරකිමු.
(iv) දේශීය වී ගොවිතැන හා බැඳුණු අපේ සංස්කෘතිය (ලකුණු 20 )

(3) ඔබ පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය 2017.07.25 දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මේ සඳහා උත්සවය ආරම්භයේ සිට අවසානය දක්වා වැඩසටහන් විස්තරය ඇතුළත් වන පරිදි උත්සව සභාවට ගැළපෙන ආකාරයේ න්‍යාය පත්‍රයක් සකස් කරන්න. (ලකුණු 10 )

(4) පහත සඳහන් කොටස්වල අවස්ථා සම්බන්ධය ලියන්න. ඒ සඳහා පහත සඳහන් ආකෘතිය භාවිත කරන්න.

(i) ''මේ කැලෑවත් යුව රජ්ජුරුවන්ගේ''
(ii) ''එහෙනම් මුළු රටම ඔහුටයි.''
(iii) ''ඇයි සොඳුර මා හඳුනා ගන්න බැරි වුනා ද?''
(iv) ''ඉතින් අපි ද මෙතැනින් වෙන් වෙමු.''
(v) ''කොහොමද දෙකම හරි වෙන්නේ'' (ලකුණු 10)

| | පාඩමේ නම | කා විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? | කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද? |
|---|---|---|---|---|
| (i) | ............ | ............ | ............ | ............ |
| (ii) | ............ | ............ | ............ | ............ |
| (iii) | ............ | ............ | ............ | ............ |
| (iv) | ............ | ............ | ............ | ............ |
| (v) | ............ | ............ | ............ | ............ |

(5) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මුතු කිමිදීම ඉතා ප්‍රචලිත වශයෙන් පැවැතියේ වසරේ ඉතා දිගු කලක් නියඟය පැවැති මන්නාරම සහ එය අවට මුහුදු ප්‍රදේශයන්හි ය. එසේම කරදිය හා මිරිදිය මුසුවීමක් ඇති විශාල ගැඹුරක් නොමැති මුහුදු කලාපයක් තුළ මුතු බෙල්ලන් බහුලවීම විශේෂයක් ලෙස දැක්විය හැකිය. පිනි බිඳුවක් හෝ වැහි බිඳුවක් මුතු බෙල්ලාගේ කටට වැටීමෙන් පසු කලකදී එය මුතු ඇටයක් බවට පත්වන බවත් නො එසේ නම් වැලි ඇටයක් බෙල්ලාගේ බඩ තුළට යාමෙන් කලක් ගත වන විට එය මුතු ඇටයක් බවට පත්වන බවත් එවක සිටි ජනතාව විශ්වාස කළ බව පෙනේ.

වී ගොවිතැන් කිරීමේදී අඳ ගොවියාට අස්වැන්නෙන් හතරෙන් එකක් ගෙවන්නාසේ, මුතු කිමිදුම්කරුවන්ට ද තමන් නෙළා ගන්නා මුහුදු අස්වැන්න කොටස් හතරකට ගොඩ ගැසූ පසු එක් කොටසක් ශ්‍රම නියුක්තිකයන්ට ප්‍රදානය වශයෙන් හිමි වී ඇත. අවශ්‍ය නම් එම කොටස ගැනුම්කරුවෙකුට විකිණිය හැකි වූ අතර නො එසේ නම් මුතු ලබා ගෙන විකිණීමට ද පුළුවන්කම තිබේ.

(i) මුතු කිමිදීම ප්‍රචලිත වශයෙන් පැවැති ප්‍රදේශය කුමක් ද?
(ii) මුතු බෙල්ලන් බහුලව සිටින්නේ කුමන මුහුදු කලාපයක් තුළ ද?
(iii) එකළ ජනතාව විශ්වාස කළ පරිදි මුතු ඇටයක් බවට පත්වන්නේ මොනවා ද?
(iv) මෙම ඡේදයේ සඳහන් උපමාව කුමක් ද?
(v) පහත සඳහන් වගන්තිවලට ගැළපෙන තනි වචනය බැගින් ඡේදයෙන් තෝරා ලියන්න.
  (අ) දීර්ඝ කාලයක් වැසි නොලැබෙන කාලය
  (ආ)වැඩි වශයෙන් පැවතීම (ලකුණු 2 x 5 = 10)

(6) (අ) පහත සඳහන් වාක්‍ය සඳහා නිවැරදි ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ගෙන නැවත ලියන්න.
  (i) මහෞෂධ පණ්ඩිතයෝ නුවණින් සතුරන් (දිනුවේය / දිනූහ)
  (ii) ගෙවිලිය ඇඹුල ගෙන කුඹුරට (ගියාය / ගියේය)
  (iii) සමහරෙක් මිහිරි ගීතයක් (රසවිඳියි / රසවිඳිති)
  (iv) පියාණෝ දරුවන්ට ආදර්ශමත් (වෙයි / වෙති)
  (v) සිව් මහා නදී මුහුදට ගලා (බසියි / බසිති) (ලකුණු 1 x 5 = 05)

(ආ) පහත දැක්වෙන අප්‍රාණවාචී නාම පදවලට සුදුසු පරිදි 'ඕ' , 'හු' යන ප්‍රත්‍ය ගන්වා වාක්‍යවල යොදන්න.
  (i) වෘක්ෂය
  (ii) තාරකා
  (iii) පියුම්
  (iv) වනස්පති
  (v) ගංගාව (ලකුණු 1 x 5 = 05)

(මුළු ලකුණු 10)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

### සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

## I කොටස

(1) - (iii) (2) - (iii) (3) - (iv) (4) - (iii) (5) - (i) (6) - (i) රෝගීහු (ii) කුමරියක්

(7) - (iii) (8) - නිවැරදි වාක්‍ය වලට ලකුණු ලබා දෙන්න.

(9) - (i) වැහි වලාවෝ අහසේ පාවෙති.
(ii) ඔවුහු අනතුරට ලක්වූවන් රෝහල වෙත රැගෙන ගියහ

(10) - (i) නිශාචර (ii) දූවමය, දාරුමය

(11) - (i) තඹරු, සියපත, පංකජ (ii) ආකාශය, නුඹ, ගුවන (12) - (i) අදක්ෂ (ii) සංකීර්ණ

(13) - (i) කෙනෙර (ii) මැසින්න (14) - (i) අවමානය (ii) නිදුක් (15) - ගොයම් පීදීම (16) - අරක්වළ

(17) - ගැඹුරු (18) - කළහොත් (19) - අනලස්ව (20) - ඉමහත් (ලකුණු 2 x 20 = 40)

## II කොටස

(1) (i) සුනිල් ශාන්ත මහතා
(ii) (අ) කුල්ල
(ආ) කමතේදී ගන්නා ආහාරය
(iii) A. P. ගුණරත්න මහතා
(iv) ආතර් සී ක්ලාක් මහතා
(v) කෝට්ටේ
(vi) හය වැනි සිරි පැරකුම්බා රජු
(vii) කුරුලු පාලුව
(viii) කුරුලු පාලුව
(ix) කමත
(x) සිරස්තලය / ශීර්ෂ පාඨය

(2) කරුණුවල සාරවත් බව (ලකුණු 08)
නිර්මාණාත්මක බව (ලකුණු 07)
ශිල්පීය දක්ෂතා
(අත් අකුරු, ඡේද බෙදා තිබීම, නිවැරදි වියරණය, අක්ෂර වින්‍යාසය) (ලකුණු 05) මුලු ලකුණු 20කි.

(3) අන්තර්ගතය (ලකුණු 04යි)
නිර්මාණාත්මක බව (ලකුණු 03යි)
පැහැදිලිබව හා අත් අකුරු (ලකුණු 03යි)

(5) (i) මන්නාරම සහ එය අවට මුහුදු ප්‍රදේශය
(ii) කරදිය හා මිරිදිය මුසුවීමක් ඇති විශාල ගැඹුරක් නොමැති
(iii) බෙල්ලා ගේ කටට වැටෙන පිනි බිඳුවක් හෝ වැහි බිංදුවක්, බෙල්ලාගේ බඩ තුළට යන වැලි ඇටයක්
(iv) වී ගොවිතැන් කිරීමේදී අද ගොවියාට අස්වැන්නෙන් හතරෙන් එකක් ගෙවන්නා සේ.
(v) (අ) නියඟය (ආ) බහුලවීම
(ලකුණු 2 x 5 = 10)

(6)(අ) (i) දිනූහ (ii) ගියාය (iii) රසවිඳිති
(iv) වෙති (v) බසියි (ලකුණු 1 x 5 = 05)

(ආ) (i) වෘක්ෂයෝ (ii) තාරකාවෝ (iii) පියුම්හු (iv) වනස්පතීහු (v) ගංගාවෝ වනුවෙන් ප්‍රත්‍ය ගත්වා උක්ත ආඛ්‍යාත පද ගැළපෙන ලෙස අර්ථවත් වාක්‍ය ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(ලකුණු 1 x 5 = 05)

(4)

| | පාඩමේ නම | කා විසින් කියන ලද්දක් ද? | කා හට කියන ලද්දක් ද? | කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද? |
|---|---|---|---|---|
| (i) | රජ කුමරියගේ දෛවය | හිඟන්නා | කුමරිය හට | කැලෑවේ ගමන් කරන අවස්ථාවේ. |
| (ii) | රණ බිම අබියස | නයනානන්ද | පිලැස්සේරාලට | පෙර සිදුවීම් විස්තර කරන අවස්ථාවේ. |
| (iii) | රජ කුමරියගේ දෛවය | යුවරජු | කුමරියට | රහස හෙළිකරන අවස්ථාවේ. |
| (iv) | රණ බිම අභියස | අසංග | නයනානන්දට | සෙනවි නික්ම ගිය අවස්ථාවේ. |
| (v) | ටීකා සීපද | සමන් පුතා | සීයාට | ටීකා සීපද කියන අවස්ථාවේ. |

(ලකුණු 2 x 5 = 10)